// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1841/2 - 2013 දෙසැම්බර් මස 17 වැනි අඟහරුවාදා - 2013.12.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත

3 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය යටතේ කරන නිවේදනය

සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ආයෝජන ප්‍රවර්ධන විෂයයභාර අමාත්‍ය ලක්ෂ්මන් යාපා අබේවර්ධන වන මම, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගෙන් ද විමසීමෙන් අනතුරුව මෙම නිවේදනය මගින්,

(1) බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ 10, ඩී. ආර්. විජයවර්ධන මාවතේ, ඇමෙරිකානු ඩොලර් මිලියන තුන්සියයක (ඇ. ඩො. මි. 300) මුළු ආයෝජනයක් සහිතව ගොඩනැගීමට යෝජිත නවීන සාප්පු සංකීර්ණයකින් සහ උසස් ස්ථරයේ නිවාස සංකීර්ණයකින් සහ කාර්යාලයීය ඉඩ පහසුකම්/සේවා සැපයීමේ ස්ථාන සඳහා ඉඩ පහසුකම් ඇතුළුව කාමර පන්සියයකින් (500) යුත් විස්තීර්ණ අධි සුඛෝපභෝගී සංචාරක නිකේතන පහසුකම් සහ ඊට ආනුශාංගික පහසුකම් ද සහිතව ගොඩනැගීමේ සහ පවත්වාගෙන යාම සඳහා වූ මෙම ව්‍යාපෘතිය, පහත සඳහන් කරුණු සැලකිල්ලට ගෙන ක්‍රමෝපාය වැදගත්කමක් සහිත ව්‍යාපෘතියක් ලෙස නම් කිරීමට හඳුනාගෙන ඇත.

(i) රටේ සංවර්ධන උපායමාර්ගයන්ට අනුකූලව ආර්ථික සංවර්ධනයට අදාළව උපරිම ප්‍රමුඛත්වයක් ලැබෙන සංචාරක කර්මාන්ත ප්‍රවර්ධනයට ඇති ඉහළ මට්ටමේ දායකත්වය ;

(ii) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ ව්‍යාපෘති සමාගම අතර අත්සන් කරන ලද ගිවිසුමේ දින සිට මාස තිස් හයක් (36) තුළ මෙරටට ලැබෙන ඇමෙරිකානු ඩොලර් මිලියන දෙසියයක් (ඇ. ඩො. මි. 200) විදේශ ආයෝජනයක් සහිතව ;

(iii) ශ්‍රී ලංකා ජනතාවට ලැබීමට අපේක්ෂිත රැකියා උත්පාදනයන් දෙදහස් අටසියයක් (2,800) සහ ඒවාට ආනුශාංගික ආදායම් ඉපයීමේ අවස්ථා පුළුල්වීම ; සහ

(iv) ජාත්‍යන්තර පිළිගැනීමක් ඇති මෙවැනි විස්තීර්ණ අධි සුඛෝපභෝගී සංචාරක නිකේතන පහසුකමක් ඉදිකිරීම හේතුවෙන් මෙරටේ ආර්ථිකයේ සිදුවෙන වෙනස්වීමත් (Economic Landscape) සමග ඉහළ වියදම් දරන විදේශ සංචාරකයන් ආකර්ශනය කර ගැනීමට ඇති හැකියාව සහ එයට සබැඳිව උත්පාදනය කරගත හැකි විදේශ විනිමය පිරිවැටුම් ලබාගැනීමේ අවස්ථා.

(2) ව්‍යාපෘති සමාගමේ නම ක්වීන්ස්බරි ලෙෂර් ලිමිටඩ් (Queeensbury Leisure Limited) ("ව්‍යාපෘති සමාගම") වේ. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාලයේ ආරම්භක දිනය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය හා ව්‍යාපෘති සමාගම අතර අත්සන් කරන ලද ව්‍යාපෘති ගිවිසුමේ සඳහන් දිනය හෝ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් දීර්ඝ කරන ලද නිශ්චිත කාල සීමාවක් ඇතුළත විය යුතු ය. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාලය ව්‍යාපෘති ගිවිසුමේ දින සිට මාස හතලිස් අටක් (48) දක්වා විය හැකිය. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාලය සම්පූර්ණ වූ වහාම ව්‍යාපෘතියේ වාණිජ මෙහෙයුම් ආරම්භ කළයුතු වේ.

1A - G 18727 — 200 (2013/12)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(3) සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 2 වැනි වගන්තිය පරිදි මෙහි පහත උපලේඛනයේ සඳහන් වූ කාලයන් සඳහා බදු හා ගාස්තු ගෙවීම් සම්බන්ධයෙන් එහි සඳහන් නීතිවලින් නිදහස් වීම් ලැබෙනුයේ පහත සඳහන් කොන්දේසි ඉටුකිරීමට යටත්වය :-

(i) මෙම ව්‍යාපෘතියේ අවම විදේශ ආයෝජනය වශයෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන දෙසියයක (ඇ. ඩො. මි. 200) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය හා ව්‍යාපෘති සමාගම අතර අත්සන් කරන ලද ගිවිසුමේ සිට මාස තිස් හයක්' (36) ඇතුළත එය කළ යුතු ය ;සහ

(ii) නිසි අධීක්ෂණය සහතික කිරීම සඳහා අදාළ ව්‍යාපෘති සමාගම ව්‍යාපෘතියේ විදේශ විනිමය ගනුදෙනු සම්බන්ධයෙන් වූ විදේශ විනිමය ගිණුම් පවත්වාගෙන යා යුතුය.

## උපලේඛනය

**(1) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත**

(i) **සංස්ථාපිත ආදායම් බදු :**

2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ විධිවිධානවලට අනුව, ව්‍යාපෘතියේ කටයුතුවලින් ව්‍යාපෘති සමාගම ජනනය කරන ලාභය සහ බද්ධ නිවාස, සාප්පු, සේවා ඉඩ පහසුකම් ස්ථාන විකිණීමෙන්, බදුදීමෙන්, කුලියට දීමෙන්, කාමර ගාස්තු සහ කුලී කරුවන්ගෙන් ලබාගන්නා කුලී ආදායම ද ඇතුළුව ලැබෙන ආදායම මත ආදායම් බදු ගෙවීම වසර දහයක (10) කාලයක් සඳහා නිදහස් කෙරේ. මෙම බදු නිදහස් කාලය ගණනය කිරීම ආරම්භ වනුයේ එකී ව්‍යාපෘති සමාගම ලාභ ඉපයීම ඇරඹූ වසරේ මුල් දින සිට හෝ එම ව්‍යාපෘතිය වාණිජමය මෙහෙයුම් ඇරඹූ දිනයේ සිට වසර තුනක් (03) සැපිරීමත් සමග, යන අවස්ථා දෙකෙන් පළමුව එළඹෙන අවස්ථාවේදීය.

ඉහත සඳහන් බදු නිදහස් කාලයේ අවසන් දිනයට ඉක්බිතිව එළඹෙන වසර දොළහක (12) කාලයක් සඳහා ව්‍යාපෘති සමාගමේ ලාභය සහ ආදායම කුලී මුදල් ආදායම ද ඇතුළුව ඒ මත අර්ධ බදු නිදහස් කිරීමක් ලැබෙන අතර, එම අර්ධ බදු ගණනය කළ යුත්තේ, ව්‍යාපෘති සමාගමේ ලාභයේ සහ ආදායමේ සියයට හයක (6%) ප්‍රතිශතයක් යන පදනම මත හෝ තත්කාලයේ දී හෝටල් කර්මාන්තයට අදාළව බලපවත්නා බදු අනුපාතයෙන් සියයට පනහක (50%) ප්‍රතිශතයක් යන පදනමෙන් අඩු අගයක් ගන්නා පදනම මතය.

එසේ වුව ද, එකී බදු නිදහස් කාලය හා අර්ධ බදු නිදහස් කාලය අවසන්වීමෙන් අනතුරුව, ව්‍යාපෘති සමාගමේ ලාභය හා ආදායම සම්බන්ධයෙන් ආදායම් බදු පනතේ විධිවිධාන ප්‍රකාර ආදායම් බදු ගෙවිය යුතු ය.

ඉහත කී ව්‍යාපෘති සමාගමේ කාර්යයන්හි විෂය ක්ෂේත්‍රය ඉක්මවා අදාළ අඥාපනත්වලට අනුකූලව විස්තීරණය කළහොත් එයින් උපයන්නා වූ ලාභ පිරිවැටුම් ධාරිතාවට අනුකූලව සහ ලාභාංශ මත සමානුපාතිකව දේශීය ආදායම් බදු පනත යටතේ සංස්ථාපිත ආදායම් බද්ද ගෙවීමේ සීමාවන්ට යටත් වේ.

(ii) **ලාභාංශ මත බද්ද :**
මුල් වසර දහයක (10) බදු නිදහස් කාලයට අදාලව සහ ඉන් පසුව වසරක කාලයකට අදාළව ව්‍යාපෘතියේ ලාභවලින් කොටස් හිමියන් වෙත බෙදා දෙනු ලබන ලාභාංශ බදුවලින් නිදහස් වේ.

(iii) **රඳවාගැනීමේ බද්ද :**

පහත සඳහන් පරිදි රඳවාගැනීමේ බදු අඩුකර ගෙවීමෙන් ව්‍යාපෘති සමාගම නිදහස් වේ :-

- ප්‍රාග්ධන වියදම් සඳහා ගන්නා ලද විදේශ ණය මත පොලිය හා තාක්ෂණික ගාස්තු ;
- කළමනාකරණ ගාස්තු හා රාජ්‍ය භාගය ගෙවීම්වලට අදාළව කරන ගෙවීම් සම්බන්ධයෙන් එකී මුළු ගෙවීම්වල එකතුව දළ මෙහෙයුම් ආදායමින් සියයට තුනක (3%) ප්‍රමාණයක් නොඉක්මවන තෙක් ;
- අලෙවිකරණ ගාස්තු සඳහා එකී ගෙවීම්වල මුළු එකතුව දළ මෙහෙයුම් ආදායමෙන් සියයට එකයි දශම පහක් (1.5%) නොඉක්ම වන තෙක් ; සහ
- කළමනාකරණ දිරිදීමනා ගාස්තු සඳහා, එකී ගෙවීම්වල මුළු එකතුව දළ මෙහෙයුම් ලාභවලින් සියයට දහයක් (10%) නොඉක්මවන තෙක්.

(iv) **උපයනවිට ගෙවීමේ බද්ද :**

ව්‍යාපෘති සමාගමේ සේවයේ නිරතවන විදේශීය කාර්යය මණ්ඩලය උපයන විට ගෙවීමේ බද්දෙන් නිදහස් විය යුතුය. මෙම සහනය එවැනි සේවකයින් විසි දෙනෙකුට (20) උපරිමයකට යටත්ව අදාල කරගත යුතු බවට සීමාවක් ක්‍රියාත්මක විය යුතුය. මෙම සහනය ව්‍යාපෘති සමාගමේ වානිජ මෙහෙයුම් ක්‍රියාකාරිත්වය ආරම්භ වන දින සිට එළැඹෙන ඉදිරි වසර පහක (05) කාල සීමාවක් සඳහා අදාල කරගත යුතුය. ව්‍යාපෘති සමාගමේ විදේශ කාර්යය මණ්ඩලය වෙනුවට ක්‍රමානුකූලව දේශීය සේවක පිරිසක් සේවයේ යෙදවීමට ව්‍යාපෘති සමාගම විසින් ව්‍යාපෘති සමාගමේ වැඩිම යහපත පිළිබඳ මූලධර්මය පදනම් කරගෙන ක්‍රියා කිරීම අවශ්‍ය විය යුතු ය.

**(2) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත**

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් අනුමත කරනු ලබන ව්‍යාපෘතියට අදාළ ආනයනය කෙරෙන භාණ්ඩ සහ දේශීය වශයෙන් මිළදීගනු ලබන භාණ්ඩ හෝ සේවා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාලය වන මාස හතලිස් අටක (48) කාලය තුල එකතු කළ අගය මත බදු ගෙවීමෙන් නිදහස් වේ. ව්‍යාපෘති සඳහා සැපයීම් කරන කොන්ත්‍රාත්කරුවෙකුට හෝ එකී කොන්ත්‍රාත්කරුවෙකුට සැපයීම් කරන උප කොන්ත්‍රාත්කරුවෙකුට ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන කාලය තුලදී පනතෙන් අවසර දී ඇති පරිදි බදු විලම්භනය (tax deferment) කිරීමට හැකිවේ.

ඉහත කරුණට යටත්ව, ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙමින් තිබුණ ද වාණිජ මෙහෙයුම් ඇරඹූ දිනයේ සිට, 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ විධිවිධාන ප්‍රකාර ව්‍යාපෘති සමාගම විසින් එකතු කළ අගය මත බදු ගෙවිය යුතු ය.

**(3) 2011 අංක 18 දරන වරාය හා ගුවන්තොටුපල සංවර්ධන බදු :**

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් අනුමත කරනු ලබන ව්‍යාපෘතියට අදාළ භාණ්ඩවලට සීමා වෙමින් එකී ව්‍යාපෘතියට අදාළ භාණ්ඩ ආනයනය කිරීම, වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්ද ගෙවීමෙන් නිදහස් වේ. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන කාලය වන මාස හතලිස් අටක (48) කාලය තුළ දී, ව්‍යාපෘති සමාගම විසින් ව්‍යාපෘතිය සඳහා සිදු කරන්නා වූ ඍජු ආනයන හෝ භාණ්ඩ ලබන්නා (consignee) ව්‍යාපෘති සමාගම වන්නේ නම්, ව්‍යාපෘතිය සඳහා කොන්ත්‍රාත්කරුවෙකු හෝ උප කොන්ත්‍රාත්කරුවෙකු විසින් සිදු කරන ආනයනයන් සඳහා මෙම නිදහස් කිරීම, පහත අංක 05 හි සඳහන් කොන්දේසිවලට යටත්ව අදාළ වේ.

**(4) 2005 අංක 5 දරන මුදල් පනත :**

ව්‍යාපෘතියේ ඉදිකිරීම් කාලය වන මාස හතලිස් අටක (48) කාලය තුල ව්‍යාපෘති සමාගමේ කොන්ත්‍රාත්කරුවන්/උපකොන්ත්‍රාත්කරුවන්, ව්‍යාපෘතියට නිසි පරිදි අදාළව 2005 අංක 05 දරන මුදල් පනත යටතේ පනවනු ලබන ඉදිකිරීම් හා කර්මාන්ත සහතික අරමුදල් බද්ද ගෙවීමෙන් නිදහස් වේ.

**(5) රේගු ආඥාපනත (235 වන අධිකාරිය) :**

අකාර්යය ලැයිස්තුවේ සඳහන් භාණ්ඩ හැර, ව්‍යාපෘතියට නිසි පරිදි අදාළ කාලය වන මාස හතලිස් අටක (48) කාලය තුල ආනයනය කරනු ලබන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් අනුමත කරනු ලබන ව්‍යාපෘතියට අදාළ භාණ්ඩ (ව්‍යාපෘති සමාගම විසින් ඍජුවම ආනයනය කරන විට හෝ ව්‍යාපෘති සමාගමේ නාමය යටතේ කොන්ත්‍රාත්කරුවෙකු හෝ උප කොන්ත්‍රාත්කරුවෙකු මගින් ආනයනය කරන විට එම භාණ්ඩ) රේගු බදුවලින් නිදහස් වේ. අකාර්ය ලැයිස්තුවේ සඳහන් භාණ්ඩ සම්බන්ධයෙන් වන විට එකී භාණ්ඩ ශ්‍රී ලංකාව තුළ පූර්ණව නිෂ්පාදනය නොකරන අවස්ථාවක හෝ එකී භාණ්ඩ අවශ්‍ය ප්‍රමාණයෙන් හෝ අවශ්‍ය ගුණාත්මකභාවයෙන් යුක්තව ශ්‍රී ලංකාවෙන් මිලදී ගැනීමට නොහැකි වන විට පමණක් හෝ ව්‍යාපෘතියේ අවශ්‍යතාවයන් අනුව නිසි කලට ශ්‍රී ලංකාවෙන් මිලදී ගැනීමට නොහැකි අවස්ථාවක දී ආනයනය කළ විට එවැනි භාණ්ඩ රේගු බද්දෙන් නිදහස් වේ.

ඒ අනුව සමස්තයක් ලෙස, ව්‍යාපෘතිය ඉහත සඳහන් පරිදි අදාළ කාලය වන මාස හතලිස් අටක (48) කාලය තුළදී කොන්ත්‍රාත්කරුවෙකු හෝ උප කොන්ත්‍රාත්කරුවෙකු මගින් ආනයනය කල හැක්කේ එම භාණ්ඩවලට අදාළව භාණ්ඩ ලබන්නා ලෙස ව්‍යාපෘති සමාගම සඳහන් විට පමණි. කිසියම් විටක ආනයනය කරන භාණ්ඩ වෙනත් ව්‍යාපෘතියකට අදාළ භාණ්ඩ සමග පොදුවේ ආනයනය කිරීමක් සිදු වුවහොත්, ව්‍යාපෘති සමාගමට දී ඇති සහන ව්‍යාපෘතියට අදාළ භාණ්ඩ සඳහා පමණක් උපයෝගී කරගත් බවට සහතික කිරීමේ පූර්ණ වගකීම ව්‍යාපෘති සමාගම සතු වන අතර, එම කොන්දේසි යම් හෙයකින් කඩකිරීමක් සිදු වුවහොත්, ව්‍යාපෘතියට අදාළ නොවන සියළුම භාණ්ඩ සම්බන්ධයෙන් ගෙවිය යුතු බදු සාමාන්‍යයෙන් අදාළ වන නීති හා රෙගුලාසිවලට අනුව වහාම ගෙවීමට සිදු වේ. ව්‍යාපෘති සමාගමේ සේවකයකුගේ, උපදේශකවරයෙකුගේ, හෝ වෙනත් අයෙකුගේ පුද්ගලික භාවිතය සඳහා ව්‍යාපෘති සමාගම විසින් ආනයනය කරනු ලබන පුද්ගලික බඩුබාහිරාදිය ව්‍යාපෘතියට අදාළ භාණ්ඩ ලෙස සලකනු නොලැබේ. තව ද ව්‍යාපෘති සමාගමට 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ ලබාදෙනු ලබන නිදහස් කිරීම් සහ සහන සැලකිල්ලට ගනිමින් ව්‍යාපෘති සමාගම සමඟ සම්බන්ධ වන යම් කුලී ගැනුම්කරුවකුට හෝ වෙනත් අයෙකුට එකී සම්බන්ධවීම හේතුවෙන් හෝ සම්බන්ධවීම කරණකොටගෙන මෙම පනත යටතේ වෙනයම් නිදහස් කිරීමක් හෝ සහනයක් දෙනු නොලැබේ.

ලක්ෂ්මන් යාපා අබේවර්ධන, පා. ම.,
ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය.

වර්ෂ 2013ක් වූ දෙසැම්බර් මස 17 වැනි දින,
කොළඹ දී ය.

01-04

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.